# ශ්‍රී ලංකාවේ
# විසම්මුතිය මර්දනය

2015 අප්‍රේල් 20 - මැයි 31



2015 මැයි 18 වන දින මුල්ලවෛකාල් හිදී පැවති අනුස්මරණ වැඩසටහනක් අතරතුර පොලීසිය විසින් පූජක වරයෙකුගෙන් ප්‍රශ්ණ කරයි (ඡායාරූපය – Seb BW)

INFORM Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

A. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කිරීම

B. රැස්වීමේ නිදහස  ඇසිරීම

C. සිහිකිරීම සඳහා වූ අයිතියට බාධා පැමිණවීම

D. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

E. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් ම  වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙ හි ශ්‍රීලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක්ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය  දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

**සාරාංශය** - රාජපක්ෂ පාලන කාලයට වඩා නිදහසක් ඇතැයි පොදුවේ දැනෙන හැඟීම වුවත් මෛත්‍රීපාල පාලන කාලය තුළදී ද ශ්‍රී ලංකාව තුළ විසම්මුතිය මර්දනය කිරීමේ සිදුවීම් වාර්තා වී තිබේ.

යුද්ධයෙන් මිය ගිය දෙමළ වැසියන් සිහි කිරීමේ වැඩසටහන් තහනම් කරමින් 2015 මැයි මස මැද භාගයේදී පොලීසිය විසින් අධිකරණ නියෝග ලබා ගත්තේය. එවැනි සමහර වැඩසටහන්හි සංවිධායකයින්, ඒවාට සහභාගී වූවන් සහ ජනමාධ්‍යවේදීන් පොලීසිය විසින් ප්‍රශ්න කරන ලදී. එම වැඩසටහන් සඳහා තෝරා ගෙන තිබූ ස්ථාන වෙනස් කිරීමට බල කරන ලද අතර අනුස්මරණ වැඩසටහන් තදබල සුපරීක්ෂිකාරිත්වයකට ලක්ව තිබුණි. මෙම වැඩසටහන් සඳහා ජනතාව ප්‍රවාහනය නොකරන ලෙස බස් හිමිකරුවන්ට ද බලපෑම් ඇති විය. 2014 නොවැම්බර් මාසයේ එල්ටීටීඊ ය සැමරීම සඳහා පහන් දැල්වීම පිළිබද ප්‍රශ්න කිරීම සඳහා මැයි මුල භාගයේදී උතුරු පළාත් සභාවේ සාමාජිකයෙකු පොලීසියට කැඳවන ලදී.

ජනමාධ්‍යවේදීන්ව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම් සඳහා කැඳවන ලද අතර ජලය දූෂණය පිළිබද රැස්වීමක් ආවරණය කිරීම බාධා පැමිණවීමක් ද අතර ප්‍රාදේශීය දේශපාලඥයෙකු විසින් ජනමාධ්‍යවේදියෙකුට පහර දුන් සිදුවීමක්ද වාර්තා විය. කොළඹ පැවති මැයි දින රැළියකදී විශ්ව විද්‍යාල ආචාර්යවරුන් දෙදෙනෙකුට පහර දෙන ලදී. ඒ අතරම සම්මානලාභී මානව හිමිකම් ආරකෂකයෙකු සහ විද්‍යාර්ථියෙකු විසින් ලියන ලද ශ්‍රී ලංකාවේ යුද්ධය සම්බන්ධයෙන් ග්‍රන්ථයක් පිළිබද සූදානම් කර තිබූ සාකච්ඡාවක් පැවත්වීමට අවසර දීම යාපනය උප කුළපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඝාතනය කරන ලද එල්ටීටීඊ රූපවාහිනී නිවේදිකාවගේ චරිතය අලලා සැකසුණු චිත්‍රපටයක් ප්‍රදර්ශණය කිරීම ඉන්දියාව තුළ තහනම් කර තබුණි.

විරෝධතාවන් විසුරුවා හැරීමට පොලීසිය අවස්ථා දෙකකදී ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර යොදා ගත්තේය. ප්‍රචණ්ඩ ලෙස හැසිරීම නිසා, සමූහ ලෙස දූෂණය කර පාසල් සිසුවියක් ඝාතනය කිරීමේ සිදුවීම් සම්බන්ධයෙන් විරෝධතාවයේ යෙදුණු සිය ගණනක් විරෝධතාකාරුවන් අත්අඩංගුවට ගන්නා ලදී. අත්අඩංගුවට පත් වූ බොහෝ දෙනෙක් ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ නොවූවන් බව ප්‍රාදේශීය ක්‍රියාකාරිකයෙකු ඉන්ෆෝම් වෙත පැවසීය. මෙම සමූහ ස්ත්‍රී දූෂණයට සම්බන්ධ විරෝධතා වැළැක්වීමට පොලීසිය අවම වශයෙන් දෙවතාවක්වත් අධිකරණයෙන් තහනම් නියෝග ලබා ගත්තේය. මේ අතරතුර සාමකාමීව විරෝධයපාමින් පොලීසිය සමග කතා බහකට එළඹි වැඩිහිටි කාන්තාවකට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු විසින් පරුෂ වචනයෙන් බැණ වැදුණු බව වාර්තා විය. එම සිදුවීම කැමරා කරමින් සිටි පුද්ගලයෙකුට අදාල පොලිස් නිලධාරියා විසින් තර්ජන කර ඇත. ඒ අතරම, විරෝධතා පැවැත්වීම සඳහා වෙන් කළ කලාප ලබා දිය යුතු බව අධිකරණ කටයුතු පිළිබද නියෝජ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කරන ලදී.

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ විරෝධතා රැළියක ශබ්ද විකාශන යන්ත්‍රයක් සිය ත්‍රි රෝද රථයේ රැගෙන යාම හේතුවෙන් ත්‍රිරෝද රියැදුරුවරයා අත්තඩංගුවට ගනු ලැබූ අතර එම විරෝධාවයට සහභාගී වූ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් කිහිපදෙනෙක්ද කළහකාරී ලෙස හැසිරුනැයි අත්අඩංගුවට පත් වූ බව වාර්තා විය. හිටපු ජනාධිපතිවරයාට සහය පල කරමින් අල්ලස් හා දූෂණ වංචා විමර්ශන කොමිසම ඉදිරියේ විරෝධතාවයකට සම්බන්ධ වූ දේශපාලඥයන් 27ක් අධිකරණයට කැඳවන ලදී.

## A. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

### 1. ජනමාධ්‍යවේදීන්ට හිරිහැර කිරීමේ සිදුවීම් තුනක්

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නිකුත් කරන ලද මාධ්‍ය ප්‍රකාශයක ජනමාධ්‍යවේදීන්ට හිරිහැර පැමිණිවීමේ සහ වාර්තාකිරීම අවහිර කිරීමේ සිදුවීම් තුනක් දැක්විණි.

- ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පැවති මාතෘ සායනයක අඩුපාඩු පිළිබඳ වාර්තා කරමින් සිටි ස්වාධීන රූපවාහිනී නාලිකාවේ වාර්තාකරුවෙකුට ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විසින් පහර දී මාධ්‍යවේදියාගේ වෘත්තීමය කටයුතු වලට බාධා එලල් කොට ඇත.
- යාපනයේ, චුන්නාකම් හිදී ජල දූෂණය පිළිබඳ පැවති සාකච්ඡාවක් ආවරණය කිරීමෙන් ජනමාධ්‍යවේදීන් වලක්වන ලදී.
- රාජකාරී අවසන් වී නිවස බලා ගමන් කරමින් සිටි ස්වර්ණවාහිණී රූපවාහිනී නාලිකාවේ මාධ්‍යවේදියෙකුට පොලීසියේ අණ නොතකා මෝටර් සයිකලය ධාවනය කළ බව පවසමින් පොලිස් නිලධාරියෙකු විසින් පහර දී ඇත. (ඉන්ෆෝම් සටහන - මෙම පහර දීම ඔහුගේ ජනමාධ්‍යවේදය ඉලක්ක කර එල්ල කළ එකක් ද යන්න පැහැදිළි නැත)

http://srilankabrief.org/2015/05/violence-against-dissents-should-be-punished-fmm/

### 2. දෙමල ජනමාධ්‍යවේදීන් සිවු දෙනෙකු ප්‍රශ්ණ කිරීම සඳහා කැඳවයි



මානික්කවාසම් ( ඡායාරූපය - අන්තර්ජාලය)

අප්‍රේල් 28 වන දින මන්නාරම සහ වවුනියාව පදනම් කර ගෙන සේවය කරන ජනමාධ්‍යවේදීන් සිවු දෙනෙකු ප්‍රශ්ණ කිරීම සඳහා පොලීසිය විසින් කොළඹට කැඳවා ඇත. එම ජනමාධ්‍යවේදීන් සිවුදෙනා වන්නේ ජාතික රූපවාහිණියේ ඇන්තනී තෙවරාජන් මාක්, ස්වාධීන රූපවාහිණියේ ජූඩ් පෙලිස්ටිස්, නිදහස් මාධ්‍යවේදී ලැම්බට් රොසයිරෝ සහ බීබීසී සහ වීරකේසරී සඳහා වාර්තා සපයන පොන්නයියා මානික්කවාගසම් යන අයයි.

http://en.rsf.org/sri-lanka-concern-over-police-harassment-of-29-04-2015,47830.html (අවසන්ප්‍රවේශය 2015 ජූනි 02)

2015 ජනාධිපතිවරණයට පෙර පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ වෙත ලැබුණු තර්ජනාත්මක දුරකතන ඇමතුමක් පිළිබඳ මෙම ජනමාධ්‍යවේදීන් සිවුදෙනාගේ ප්‍රශ්ණ කොට ඇත. මෙම ජනමාධ්‍යවේදීන් සිවු දෙනාටද එම දුරකතන අංකයෙන් එදිනම ඇමතුම් ලැබී තිබුණු අතර ඔවුන්ට ද තර්ජන එල්ල වූවා දැ යි දැන ගැනීම සඳහා කොලඹ අපරාධ විමර්ශන ඒකකය විසින් මෙම ප්‍රශ්ණ කිරීම සිදු කර ඇත. මේ කාලය තුළ තමන්ට තර්ජනාත්මක දුරකතන ඇමතුම් එල්ල නොවූ බවත් තමන්ට ලැබෙන දුරකතන ඇමතුම් සියල්ලේම වාර්තාවක් තමන් ලග නොමැති බවත් ජනමාධ්‍යවේදීන් විසින් කොළඹ අපරාධ විමර්ශන ඒකකය වෙත දන්වා ඇත.

http://mirror.lk/news/item/3681-tamil-journalists-quizzed-for-4-hrs
(අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)
(ඉන්ෆෝම් සටහන - මෙම සිදුවීම ජනමාධ්‍ය වෘත්තිය හා සම්බන්ධ එකක් දැයි පැහැදිළි නැත)

### 3. යාපනයේ දෙමළ ජනමාධ්‍යවේදියෙකුගෙන් ප්‍රශ්න කරයි

මාධ්‍යවේදී ජේම්ස් ජෝසෆ් ෆනැන්ඩු අප්‍රේල් 26 වන දින පොලීසියට කැඳවා ප්‍රශ්ණ කළ බව වාර්තා විය. මෙම ප්‍රශ්ණ කිරීම සිදු කර ඇත්තේ 2009 වර්ෂයේදී උතුරු පළාතේ නැවත පදිංචි කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය යටතේ ගත් යම් යම් ක්‍රියාමර්ග විවේචනය කරමින් වීරකේසරී පුවත්පතට ලියන ලද

ලිපියක් සම්බන්ධයෙන්ය. එවකට නැවත පදිංචි කිරීමේ අමාත්‍යවරයා වූයේ වර්තමාන වෙළඳ හා කර්මාන්ත ආමාත්‍යවරයාය.
http://en.rsf.org/sri-lanka-concern-over-police-harassment-of-29-04-2015,47830.html
(අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

### 4. යාපනයේදී මාධ්‍යවේදියෙකු සහ ශිෂ්‍යයන් දෙදෙනෙකු රුදවුම් බාරයට

යාපනයේදී 23 වන දින උදැසන ප්‍රාදේශීය ජනමාධ්‍යවේදියෙකු සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් දෙදෙනෙකු ඇතුළු තවත් පුද්ගලයන් තිදෙනෙකු අත්තඩංගුවට ගෙන ඇත. අදාල පුද්ගලයන් රැඳී සිටි යාපනය විශ්වවිද්‍යාලය අසල පිහිටි නිවසකට පොලිස් නිල රථයකින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසුණු ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් මේ පුද්ගලයන්ව රදවා තබා ගෙන ඇත. මෙම සිදුවීම පිළිබද වූ මාධ්‍ය වාර්තා කිසිවක් අත්අඩංගුවට ගැනීමට හේතුව දක්වා නොතිබුණේ පොලීසිය විසින් අත්අඩංගුවට ගැනීමට හේතුව ප්‍රකාශ කර නොතිබූ නිසාය. මෙම පිරිස අප්‍රේල් 27 වන දින දක්වා රැදවුම් භාරයේ තබා තිබුණි.
http://tamilguardian.com/article.asp?articleid=14533

### 5. ඝාතනය කරන ලද එල්ටීටීඊ ජනමාධ්‍යවේදිනිය පිළිබදව නිෂ්පාදිත චිත්‍රපටය තහනම් වේ

ඉසිප්‍රියා නැමති එල්ටීටීඊ රූපවාහිනී මාධ්‍යවේදිනියගේ ජීවිත කතාව අලලා සැකසුණු ‘පොර්කලාති ඔරු පූ’ නම් වූ චිත්‍රපටය ඉන්දියාවේ චිත්‍රපට සහතික කිරීම් පිළිබද මධ්‍යම මණ්ඩලය (CBFC) විසින් ප්‍රතික්ෂේප කර ඇත. 2009 වර්ෂයේ යුද්ධයේ අවසන් අදියරෙහි දී යුධ හමුදා භාරයේ සිටියදී ඇය ඝාතනය කරන ලද බවට ශ්‍රී ලංකා යුධ හමුදාවට චෝදනා එල්ල වී ඇත. විදේශීය රාජ්‍ය සමග පවතින මිත්‍රශීලී සම්බන්ධයට බාධාවක් වනු ඇති බව දක්වමින් මෙම ප්‍රතික්ෂේප කිරීම සිදු කර ඇත. අදාල තීරණය වෙනුවෙන් පෙනී සිටිමින් චිත්‍රපට සහතික කිරීම් පිළිබද මධ්‍යම මණ්ඩලයේ කළාපීය සභාපති එස්. වී ශේකර් ප්‍රකාශ කර සිටියේ චිත්‍රපට මණ්ඩලය විසින් සිනෙමාරූපිතය පිළිබද වූ පණත අනුව මෙම තීරණය ගෙන ඇති බවයි.
http://www.thehindu.com/news/cities/chennai/film-on-slain-lankan-tv-journalist-banned/article7245848.eceVv (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

### 6. යුද්ධාවසානය පිළිබද ලියැවුණු ග්‍රන්ථයක් පිළිබද යාපනය විශ්ව විද්‍යාලයේ දී පැවති සාකච්ඡාවකට බාධා

2015 අප්‍රේල් 24 වන දින යාපනය විශ්ව විද්‍යාලයීය විද්‍යා ගුරුවරුන්ගේ සංගමය (JUSTA) විසින් එහි සාමාජිකයෙකු වන රාජන් හූල් විසින් ලියන ලද බිඳුණු තල් රුක ග්‍රන්ථය පිළිබද පුස්තකාල ශ්‍රවණාගාරයේදී සංවිධාන කර තිබූ සාකච්ඡාව තහනම් කිරීමට විශ්ව විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන්ගේ සහය ඇතිව උප කුළපතිවරයා උත්සාහ ගෙන ඇත. කෙසේ වුවත් විශ්ව විද්‍යාලයීය විද්‍යා ගුරුවරුන්ගේ සංගමය සාකච්ඡාව කෙසේ හෝ පවත්වා ඇත. මෙම සාකච්ඡාව තහනම් කරන ලෙස විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන්ගේ සංගමය සහ විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගමය විසින් තමා වෙත ඉල්ලීමක් කළ බවත් සාකච්ජාව තහනම් කිරීමේ තීරණය ගන්නා ලද්දේ පීඨාධිපති කමිටුව විසින් මිස තමා විසින් නොවන බව උප කුළපතිවරයා බීබීසී දෙමළ සේවයට ප්‍රකාශ කර තිබුණි.
http://oneislandtwonationsblogspotcom.typepad.com/blog/2015/05/banning-historical-memory-questions-of-politics-quality-academic-freedom-in-jaffna.html

## 7. විද්‍යාර්ථීන් දෙදෙනෙකුට දේශපාලන රැළියකදී ප්‍රහාර



ආචාර්ය දේවසිරි සහ ආචාර්ය කුමාර (ඡායාරූපය: අන්තර්ජාලයෙනි)

විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ හිටපු සභාපති සහ එහි වත්මන් මාධ්‍ය ප්‍රකාශක ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි සහ ආචාර්ය කුමුදු කුසුම් කුමාර යන මහත්වරුන්ට කිසියම් පිරිසක් විසින් මැයි 1 වන දින කිරුළපනදී සාහසික ලෙස පහර දී තිබුණි. මේ ප්‍රහාරය එල්ල වන විට ආචාර්ය නිර්මාල් රංජිත් සහ කුසුම් කුමාර යන මහත්වරුන් විමල් වීරවංස, වාසුදේව නානායක්කාර සහ දිනේශ් ගුණවර්ධන යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් සංවිධානය කළ මැයි දින රැලිය පැවැත්වෙන ස්ථානය අසල රැඳී සිට ඇත. ඔවුනට පහර දුන් පිරිස් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පරාජයට වගකිව යුත්තේ මොවුන් බව කියමින් කෑ ගැසූ බව කියවේ. රැළිය සඳහා ආරක්ෂාව සැපයූ පොලිස් නිලධාරීන්ගේ සහයෙන් ප්‍රහාරකයින්ගෙන් බේරී පලා යාමට දේවසිරි සහ කුසුම් කුමාර යන මහත්වරුන් සමත් වී ඇත. මෙම විද්‍යාර්ථීන් එම ස්ථානයෙන් ඉවතට ගෙන ගිය පොලිස් ජීප් රථයටද ප්රහාරකයින් පහර දීමට උත්සහ දරා ඇත.

http://srilankabrief.org/2015/05/the-futa-statement-on-the-attack-on-dr-nirmal-ranjith-dewasiri-and-dr-kumudu-kusum-kumara/#more-23510 (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

# B. රැස්වීමේ නිදහස

## 8. ඉඩම් ගැටළුවක් පිළිබඳ විරෝධතාවයේ නියැලීම හේතුවෙන් ගම් වාසීන්ට තර්ජන

ගම්වැසියන්ට අයත් පෞද්ගලික ඉඩම් රජයට පවරා ගත්තැයි චෝදනා කරමින් රජයේ දිස්ත්‍රික් ලේකම් වරයාට විරුද්ධ මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන්හි ගම්වාසීන් මැයි 13 වන දින විරෝධතාවයක් පවත්වන ලදී. මෙසේ ලබා ගත් ඉඩම් නැවත පවරා දෙන ලෙස දිසා ලේකම්වරයා විසින් දැනුම් දී ඇතත් එලෙස කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයා අපොහොසත් ඇති බව වාර්තා විය. ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්යාලට ඉදිරිපිට පැවති මෙම විරෝධතාවය අතරතුර කාර්යාලයෙන් ඉවත පැමිණි නිලධාරීන් විසින් තමන්ට තර්ජනය කළ බව විරෝධතාකරුවෝ කියා සිටියහ.

http://www.tamilguardian.com/article.asp?articleid=14734 (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

## 9. විරෝධතා සීමා කිරීමට නීති

මහජන විරෝධතා පැවිත්වීම යම් යම් ප්‍රදේශ වලට සීමා කරමින් නීති හඳුන්වා දිය යුතු බව අධිකරණ නියෝජ්‍ය අමාත්‍ය සුජීව සේනසිංහ මහතා මාධ්‍යයට ප්‍රකාශ කර තිබුණි. සාමාකමී විරෝධතා වලට ඉඩ ලබා දීමත්, ක්‍රියාකාරීන්ගේ, සේවකයන්ගේ සහ මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා

මෙවැනි නීති අවශ්‍ය බවත් දැනට පැවැත්වෙන විරෝධතා මගින් මහජනතාව අපහසුතාවයට වන බවත් සේනසිංහ මහතා කියා සිටියේය. එම නිසා වෙනත් බොහෝ රටවල් වල ඇතිවාක් මෙන් විරෝධතා පැවැත්වීම යම් යම් ප්‍රදේශ වලට සීමා කළ යුතු බව හෙතෙම තව දුරටත් කියා සිටියේය. ශ්‍රී ලංකාව තුළ මේ වන විට විරෝධතා සඳහා වෙන් වූ කළාප නම් කර නොමැති බවත් එවැනි පොදු ස්ථාන ඇති කළ යුතු බවත් ඔහු කියා සිටියේය.
http://www.thesundayleader.lk/2015/04/26/laws-sought-to-restrict-protests/ (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

## 10. ඝාතන සැකකරුවෙක් නිදහස් කිරීමට විරෝධය පෑ පුද්ගලයන්ව විසුරුවා හැරීමට ජල ප්‍රහාර සහ කඳුළු ගෑස්




විරෝධතාවය අසල රැඳී සිටි පොලිස් නිලධාරීන් ( ඡායාරූපය: ලංකාදීප)

මැයි 28 වන දින ඇඹිලිපිටිය - රත්නපුර මාර්ගය අවහිර කරමින් විරෝධතාවයේ නියැළුණු කොටකෙතන කහවත්ත විරෝධතාකරුවන් විසුරුවා හැරීමට පොලීසිය විසින් ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර යොදා ගන්නා ලදී. ඇඹිලිපිටිය - රත්නපුර ප්‍රධාන මාර්ගය අවහිර කරමින් සිටි විරෝධතා කරුවන් පොලිස් නිලධාරීන්ට ගල් ප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් පිරිස විසුරුවා හැරීමට ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීමට පොලීසියට සිදු වූ බල පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස් අධිකාරී රුවන් ගුණසේකර මහතා පැවසීය. ද්විත්ව ඝාතනයක සැකකරු නිදහස් කිරීමට විරෝධය පෑම සඳහා මෙම විරෝධතාවය පවත්වා ඇත.
http://www.dailynews.lk/?q=police-legal/water-cannon-tear-gas-used-disperse-kotakethana-protestors#sthash.fKjyX9LV.dpuf (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

## 11. කුණු කසල ගැටලුවක් පිළිබඳ විරෝධතාවක් පොලසීය විසින් විසුරුවා හරියි

මීතොටමුල්ල කසල කන්ද පිළිබඳව ගම්වාසීන් විසින් අවිස්සාවේල්ල කොළඹ ප්‍රධාන මාර්ගය අවහිර කරමින් විරෝධතාවක නියැලී ඇත. අක්කර 16 ක පමණ පැතිරී ඇති කසල කන්ද ඉවත් කරන ලෙස බල කරමින් දහසකගෙන් පමණ යුක්ත වූ මෙම විරෝධතාකරුවන් ටයර් පුළුස්සමින් මාර්ගය අවහිර කළ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස් අධිකාරී රුවන් ගුණසේකර මහතා ප්‍රකාශ කළේය. අසල තිබූ මෝටර් රථ සේවා සපයන ආයතනයකට බාධා වන සේ ටයර් පුළුස්සමින් සිටි

විරෝධතාකරුවන් විසුරුවා හැරීමට පොලීසිය ජල ප්‍රහාර යොදා ගෙන ඇත. මෙහිදී එක් විරෝධතාකරුවෙක් තුවාල ලබා ඇති අතර ඉහතෙම කොළඹ ජාතික රෝහලට ඇතුළත්කර ඇත.
http://www.dailynews.lk/?q=police-legal/police-disperse-meethotamulla-protestors#sthash.0kFVtbit.dpuf
(අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)



විරෝධතාකරුවන් විසුරුවා හැරීමට පොලීසිය ජල ප්‍රහාර එල්ල කළේය (ඡායාරූපය : Asian Mirror)

**12. වැඩිහිටි විරෝධතාකාරිණියකට ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරියෙක් පරුෂ වචනයෙන් බැණ වදියි - සිදුවීම වීඩියෝගත කිරීම නවත්වයි**

පාසල් ශිෂ්‍යාවක් සමූහ ලෙස දූෂණය කර ඝාතනය කිරීමේ සිදුවීමට විරෝධය පාමින් සිටි වැඩිහිටි කාන්තාවකට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු විසින් පරුෂ වචනයෙන් බැණ වැදී ඇති අතර එම සිදුවීම වීඩියෝ ගත කල පුද්ගලයෙකුට එය නවත්වන ලෙස තර්ජනය කර ඇත.
https://www.colombotelegraph.com/index.php/video-of-sinhala-police-officer-using-racially-motivated-language-at-an-elderly-jaffna-woman-goes-viral/ (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

**13. යාපනයේ විරෝධතා තහනම්වේ - විරෝධතා කරුවන් රැඳවුම් භාරයට**

යාපනය අධිකරණ භූමිය ඉදිරිපිට පැවති විරෝධතාවයකදී කිසියම් පිරිසක් කලහකාරී ලෙස හැසිරීම හේතුවෙන් යාපනයේ විරෝධතා පැවැත්වීම තහනම් කරමින් අධිකරණය විසින් මැයි 22 වන දින නියෝගයක් නිකුත් කරන ලදී. ජනතා බලය, යාපනය කාන්තා සංවිධානය සහ උතුරු පළාත් සභා සභික ආනන්දි සශිධරන් මහත්මියට විරුද්ධව මෙම තහනම් නියෝගය නිකුත් කර තිබුණි. නීති විරෝධී ලෙස එක්රැස්වීම සහ යාපනය අධිකරණ භූමියට ගල් ප්‍රහාර එල්ල කිරීම යන චෝදනා මත සැකකරුවන් 130ක් පමණ රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණි. පාසල් ශිෂ්‍යාවක් සමූහ ලෙස දූෂණය කර ඝාතරන කිරීමේ සිදුවීමට අදාල ප්‍රධාන සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම තුළ අධිකරණ භූමිය අසල රැස් වී සිටි විරෝධතාකරුවන් කළහකාරී ලෙස හැසිරී ඇත.
http://www.dailymirror.lk/73529/protests-banned-in-jaffna#sthash.cvtT2bTF.dpuf (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

**14.** **චුන්නාකම් හි විරෝධතාවයකට අධිකරණයෙන් තහනම් නියෝග**

පාසල් ශිෂ්‍යාවක් සමූල ලෙස දූෂණය කර ඝාතනය කිරීමේ සිදුවීම සම්බන්ධයෙන් විරෝධතා පැවැත්වීම දින 14ක් යන තුරු තහනම් කරමින් යාපනයේ මුලක්කාම් අධිකරණය විසින් මැයි 26 වන දින නියෝගයක් නිකුත් කළේය. මෙම නියෝගය නිකුත් කරනු ලැබුවේ පොලීසිය විසින් අධිකරණයෙන් කළ ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව ය. අදාල සිදුවීම පිළිබඳව ඉදිරියේදී විරෝධතා පවත්වනු ඇතැයි යන උපකල්පනය මත මෙම නියෝගය ඉල්ලා සිටි බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස් අධිකාරී රුවන් ගුණසේකර මහතා ප්‍රකාශ කළේය. අවුරුදු 17ක් වයසැති පාසල් ශිෂ්‍යාවක් සමූල ලෙස දූෂණය කර ඝාතනය කිරීමේ සිදුවීම මුල් කරගෙන දිවයිනේ උතුරු ප්‍රදේශ වල මහජන විරෝධතා ඇවිලී ගියේය.
http://www.colombopage.com/archive_15B/May26_1432652194CH.php (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

## C. සිහිකිරීම් සඳහා වූ අයිතිය

**15.** **යුද්ධයෙන් මියගිය පුද්ගලයන් සිහි කිරීම වෙනුවෙන් උතුරු පළාත් සභිකයෙකුව පොලීසියට කැඳවයි**

මහා වීර දිනය නිමිත්තෙන් 2014 නොවැම්බර් 27 වන දින සිය නිවසේ පහන් දැල්වීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම සඳහා උතුරු පළාත් සභාවේ සාමාජික ටී. රවිකරන් මහතාව පොලීසිට වෙත කැඳවා ඇත. මෙම කැඳවීමට අදාල සිංහලෙන් ලියන ලද දැන්වීම පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් මැයි 04 වන දින රවිකරන් මහතා වෙත බාර දී ඇත. විමර්ශනය සඳහා රවිකරන් මහතාව මුලතිවු පොලිස් ස්ථානයට කැඳවන ලෙස කොළඹින් නියෝගයක් ලැබී තිබුණු බව මාධ්‍ය වාර්තා වල දැකිවිණි.
http://www.tamilguardian.com/article.asp?articleid=14631(අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

**16.** **උතුරේ යුද්ධයෙන් මියගියවුන් සිහිකිරීමමේ වැඩසටහන් වලට වලට බිය ගැන්වීම්, හිරිහැර සහ සෝදිසි**

යුද්ධයෙන් මියගිය පුද්ගලයන් සිහි කිරීම සඳහා මැයි 18 වන දින උතුරු සහ නැගෙනහිර පළාත්වල වැඩසටහන් ගණනාවක් සංවිධානය කර තිබුණි. එම වැඩසටහන් සම්බන්ධයෙන් ආරක්ෂක අංශ මහත් සෙවිල්ලකින් සිටි අතර , ප්‍රශ්ණ කිරීම්, අධිකරණ තහනම් නියෝග සහ වෙනස් ආකාරයේ හිරිහැර සහ බියවැද්දවීමේ සිදුවීම් 10කට වඩා ප්‍රමාණයක් ඇසින් දුටුවන් සහ මාධ්‍ය වාර්තා කළේය. මෙම සිදුවීම බොහොමයක් සිදු කර ඇත්තේ සිවිල් ඇඳුමින් සැරසුනු බුද්ධි අංශ නිලධාරීන් සහ නිල ඇඳුම් ලූ පොලිස් නිලධාරීන් විසිනි. එවැනි සිදුවීම් කිහිපයක් සඳහා උදාහරණ පහත දැක්වේ.

- දෙමළ ජාතික මහජන පෙරමුණේ මුල්ලිවෙක්කාල් වැඩසටහනට විරුද්ධව අධිකරණ නියෝගයක් ලැබීම.
- පොලීසිය විසින් වෙනත් කාන්තා කණ්ඩායමකටද ඔවුන්ගේ වැඩසටහන නැවැත්වීම සඳහා එම අධිකරණ නියෝගයම පෙන්වීම
- මන්නාරමේ වැඩසටහනක් සඳහා අධිකරණ තහනම් නියෝගයක් ලබා ගැනීම
- මඩකලපුව නැගෙනහිර විශ්ව විද්‍යාලයේ පැවැත්වීමට යොදා තිබුණු වැඩසටහන පොලීසිය විසින් තහනම් කළ බව වාර්තා විය
- ත්‍රිකුණාමලයේ වැඩසටහන පැවැත්වීමට යොදාගෙන තිබුණු ස්ථානය වෙනස් කරන ලෙස පොලීසිය සංවිධායකයින්ට බල කිරීම
- කිලිනොච්චියේ ආගමික වැඩසටහනක් අතරතුර පොලීසය විසින් පූජකවරයෙකු ගෙන් ප්‍රශ්ණ කිරීම

- මුල්ලිවෙකාල් හි පැවති ආගමික වැඩසටහනක් අතරතුර එයට සහභාගී වූවන්ගෙන් සහ ජනමාධ්‍යවේදීන්ගෙන් ප්‍රශ්න කිරීම
- මුල්ලිවෙකාල් පල්ලියට ජනතාව ප්‍රවාහණය කිරීමෙන් වළකින ලෙස ඉරනපාලෙ බස් රථ හිමිකරුවන්ව බිය ගැන්වීම
- පොලීසිය විසින් මඩකළපුව දිස්ත්‍රික්කයේ වාකරෙයි හි පැවති වැඩසටහනකට සහභාගී වූවන්ගේ විස්තර රැස් කිරීම
- බුද්ධි අංශ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් යාපනය විශ්ව විද්‍යාලය අවට යොදවා තිබුණු බව වාර්තා විය
- පොලීසිය විසින් උතුරු පළාත් සභාපති ගේ මූලිකත්වයෙන් මුල්ලිවෙකාල් හි පැවති වැඩසටහනට යමින් සිටි පිරිසගේ වාහන නවත්වා ඔවුන්ගෙන් කොහේ යන්නේදැයි ප්‍රශ්ණ කිරීම.

http://groundviews.org/2015/05/20/tamils-in-north-east-sri-lanka-remember-those-killed-despite-intimidation-and-surveillance/ (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)



මුල්ලිවෙකාල් පල්ලියේ පැවති අනුස්මරණ වැඩසටහනක් (ඡායාරූපය : ටැමිල් ගාඩියන්)

මුල්ලිවෙකාල් හි පැවති අනුස්මරණ වැඩසටහන සංවිධානය කළ ප්‍රධානියෙකු වූ ඉලිල් රාජේන්ද්‍රන් පියතුමාගේ සාක්ෂිය:

" වෙනත් අනුස්මරණ වැඩසටහන් වලට සහාභාගී නොවන ලෙස අපරාධ විමර්ශන නිළධාරීන් (සීඅයිඩී) විසින් ප්‍රදේශයේ ජනතාවට අණ කර ඇති නිසා මුල්ලිවෙකාල් හි පැවැත්වීමට නියමිත ආගමික මෙහෙයට කිසිදු පුද්ගලයෙකු සහභාගී නොවනු ඇති බව පවුලක් පැමිණ මා හා පැවසුවා. අසාමාන්‍ය ලෙස සීඅයිඩී සහ ආරක්ෂක හමුදා නිලධාරීන් වැඩි පිරිසක් ගැවසෙන බවත් ඒ නිසා බියත් ඇති වී ඇති නිසා පල්ලියට පැමිණෙන ලෙස පල්ලිය අසල ජීවත් වන ජනතාව 18 වන දින උදෑසන මට දුරකතන ඇමතුමක් දී පැවසුවා. මා සමග එහි යාමට සිංහල පූජකවරයෙකුගෙන් ඉල්ලා සිටින්නට මට සිදු වුණා. මීසම භාර පූජක තුමා එහි පැමිණි විට ඔහු සංවිධානය කරන්නේ කුමක් දැයි සීඅයිඩී නිලධාරීන් විසින්

එතුමාගෙන් විමසුවා. ආගමික මෙහෙය අවසන් වන තුරු මුළු දිනය පුරාම සුදු ඇඳ ගත් පුද්ගලයන් දෙදෙනෙකු අසල ගසක් යට වාඩි වී සියළුම දේ පටිගත කර කර ඔවුන්ගේ අණ දෙන්නන් වෙත යැවුවා.

මෙම ආගමික මෙහෙයට ජනතාව ප්‍රවාහනය කළොත් එහි ප්‍රතිවිපාක ලැබෙන බවට ලැබුණු නාඳුනන දුරකතන ඇමතුමක් හේතුවෙන් බස් හිමියන් ජනතාව ප්‍රවාහනය කිරීම ප්‍රතික්ෂේප කර ඇති බව වෙනත් පූජකතුමෙක් මට දුරකතනයෙන් කතා කර පැවසුවා. එම පූජකතුමා විසින් ආගමික මෙහෙයට ජනතාව ගෙන යන මෙන් තවත් බස් හිමියන් 7 දෙනෙකුගෙන් ඉල්ලා සිටියත් ඔවුන්ට ලැබුණු තර්ජනතාමක දුරකතන ඇමතුම් නිසා ඔවුන් සියළු දෙනාම ඉල්ලීම ප්‍රතිකෂේප කළා. ජනතාවට පැමිණීම සඳහා විකල්ප ප්‍රවාහන ක්‍රමයක් යොදා ගන්නට මට සිදු වුණා. එහිදීද තර්ජනාත්මක දුරකතන ඇමතුම් පිළිබඳ ප්‍රවෘත්තිය පැතිරී තිබුණ නිසා පල්ලියට ඒමට කිසිවෙකු ඉදිරිපත් වුණේ නෑ. අපගේ අනුස්මරණ වැඩසටහනත් සෙසු වැඩසටහන වගේ කඩාකප්පල් කරනු ඇත්දැයි අන්තිම මොහොත වන තුරු අපි සැක කළා. නමුත් අසල ගම්මාන වලින් 500 පමණ ජනතාවක් මළවුන් සිහිකරන්නට පල්ලියට පැමිණියා. මේ අතරින් වැඩි පිරිසක් වූයේ කාන්තාවන්. මේ විදියට ඔනුන්ට ශෝකය ප්‍රකාශ කිරීම ඉඩ ලැබුණු පළමු අවස්ථාව මෙය බව මම සිතනවා. ආරක්ෂක අංශ වල අනාරාධිත අමුත්තන් විසින් ආගමික මෙහෙයට සහභාගී වූවන්නට ඡායාරූප ගත කළා. ඉන් වැඩි පිරිසක් වූයේ ශ්‍රී ලංකා රාජ්‍යයට තර්ජනයක් නොමැති ශෝක බරිත කාන්තාවන්. ජනතාව රැස්ව සිටි පිරිසේ ඡායාරූප ගනිමින් සිටි සිවිල් ඇඳුමින් සිටි බුද්ධි අංශ නිළධාරීන්ගේ ඡාජාරූප ගැනීමට පටන් ගත්තා. එවැනි එඩිතර බවක් මා දැක්කේ පළමු වතාවට. ආගමික මෙහෙය අවසානයේදී එයට සහභාගී වූ විදේශීය පුද්ගලයන් දෙදෙනෙකුගෙන් පොලීසිය විසින් ඔවුන් එතැනට ආවේ මන්දැයි ප්‍රශ්න කරනු ලැබුවා.
http://srilankabrief.org/2015/05/tamils-brave-harassment-threats-to-mourn-their-dead (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

## D. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

### 17. විරෝධතාවයකට පසු විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අත්අඩංගුවට

ශ්‍රී ජයවර්ධනපුර කළමණාකරණ පීඨයේ ශක්ති මාපවිට සහ කැළණිය සමාජවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශ්ව දනන්ජය ද සිල්වා යන ශිෂ්‍යයන් මැයි මස 11 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් නියෝග කරන ලදී. අධිකරණය විසින් මෙම නියෝගය ලබා දුන්නේ අප්‍රේල් 29 වන දින පැවති අන්තර් විශ්ව විද්‍යාලයීය භික්ෂු පෙරමුණ විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරිපිට සංවිධානය කරන ලද විරෝධතා පා ගමන අතර තුර පොදු දේපල වලට හානි සිදු කිරීම සහ පොලිස් නිලධාරියෙකුට පහර දීම යන චෝදනා යටතේය. (මෙම සිදුවීමේ දින වශයෙන් අප්‍රේල්ල 30 සහ මැයි 09 යන දිනයන්ද අදාල වාර්තාවේ සහදන් වේ.) විෂයන් අව ප්‍රමාණ කිරීම සහ විශ්ව විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ප්‍රමාණය අවම කිරීම සඳහා ගත් තීරණයකට විරෝධය පෑම සඳහා මෙම විරෝධතාවය පැවැත්විණි. “පොලීසිය ඔවුන්ව ලුහු බදිමින් පැමිණ අත්අඩංගුවට ගත්තා. ඔවුන්ගේ ජංගම දුරකතන පොලිස් භාරයට ගෙන ඔවුන්ව රහසේ පොලිස් ස්ථානය තුළ රඳවාගෙන සිටියා. මේ ආණ්ඩුව විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට පහර දී, ශිෂ්‍ය සංගම් නියෝජිතයන්ගේ සහ ශිෂ්‍ය ක්‍රියාකාරීන්ගේ නිවෙස් වලට මහ රෑ කඩා වැදී ඔවුන්ව බිය වද්දා තිබෙනවා. මාපවිට සහ ද සිල්වා යන ශිෂ්‍යයන් වහාම නිදහස් කරන මෙන් අපි ආණ්ඩුවට බල කරනවා.” යනුවෙන් අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු නජිත් ඉන්දික කියා සිටියේය.
https://www.ceylontoday.lk/51-91934-news-detail-ugrads-agitate-call-for-release-of-two-in-remand.html
(අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

**18. ශිෂ්‍ය විරෝධතාකරුවන්ට ශබ්ද විකාශන යන්ත්‍රයක් සැපයීම හේතුවෙන් රුදවුම් භාරයට**

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ විරෝධතාවයකට සහයෝගය දක්වමින් සිය ත්‍රි රෝද රථයේ ශබ්ද විකාශන යන්ත්‍රයක් රැගෙන යාම වෙනුවෙන් සුගත් ප්‍රසන්න ලියනගේ නැමත්තාව මැයි 25 වන දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතා විසින් මැයි 11 වන දින නියෝග කළේය.

http://www.lankadeepa.lk/index.php/articles/315830 (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)

## E. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

**19. විරෝධතාකරුවන්ව අධිකරණයට කැදවයි**

අධිකරණ නියෝගයක් නොසලකා අප්‍රේල් 23 වන දින අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම ඉදිරිපිට පවත්වන ලද විරෝධාතවයක් සම්බන්ධයෙන් පුද්ගලයන් 27 දෙනෙකුට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතා විසින් අප්‍රේල් 24 වන දින අධිකරණයට පැමිණෙන ලෙස දන්වා යවා තිබුණි. මේ පිරිස අතර එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රමුඛ පෙළේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ද විය. මෙසේ අධිකරණයට කැදවන ලද පිරිසට එදිනම උසාවියෙන් ඇප ලබා දී තිබුණි.

http://www.sundayobserver.lk/2015/04/26/new03.asp (අවසන් ප්‍රවේශය 2015 ජූනි 02)